# ලංකා විදුලිබල මණ්ඩලය

## ව්‍යාපෘති අංශය

## ඇබෑර්තු කොන්ත්‍රාත් පදනම

ලංකා විදුලිබල මණ්ඩලයේ තාප විදුලිබල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත පාරිසරික හා සමාජ ආරක්ෂණ සහකාරවරයෙකු බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම්, පළපුරුද්ද සහ වෘත්තීය නිපුණතා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාරිසරික හා සමාජ ආරක්ෂණ සහකාර - ඇබෑර්තු 01 කි.**

**සුදුසුකම් හා අත්දැකීම් :**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ජීවවිද්‍යාව, පාරිසරික විද්‍යාව කළමනාකරණය / ස්වාභාවික සම්පත් කළමනාකරණය, වන විද්‍යාව, කෘෂිකර්මාන්තය හෝ වෙනත් ආශ්‍රිත විද්‍යා ක්ෂේත්‍රයන්හි පළමු උපාධිය.
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පාරිසරික විද්‍යාව හෝ පරිසර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම්.
- පාරිසරික අධීක්ෂණ හා සමාජ ආරක්ෂණ ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ අවුරුදු 1 කට වැඩි පළපුරුද්ද.

**වයස් සීමාව :** අවුරුදු 40ට නොවැඩි

**වේතනය :** අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද මත වැටුප් සාකච්ඡා කරගත හැකි අතර, එය 2019 මාර්තු 15 දිනැති මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2019/01 ට යටත් වේ.

**තෝරා ගැනීම :** තෝරා ගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින්

**කාර්යය ස්ථානය :** ව්‍යාපෘති කාර්යාලය කොළඹ

(පාරිසරික හා සමාජ ආරක්ෂණ සහකාර නොරොච්චෝලෙහි වැඩබිමෙහි සේවයෙහි නිරත විය යුතු අතර, අවශ්‍යතාවය අනුව කොළඹ ව්‍යාපෘති කාර්යාලයටද වාර්තා කළ යුතුය.)

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය හා වේලාව:**

2021පෙබරවාරි මස 12 වැනිදා පෙරවරු 10.00

**වෘත්තීය සහ වෙනත් නිපුණතා :**

- විශේෂඥතාවය මත නිශ්චිත ක්ෂේත්‍රයන්හි ව්‍යාපෘති පාරිසරික හා සමාජ ආරක්ෂණ ආශ්‍රිත ක්‍රියාකාරකම් ස්වාධීනව හැසිරවීමේ හැකියාව.
- මහජන සම්බන්ධතා කුසලතා.
- පරිගණක භාවිතය පිළිබඳ කුසලතාවය.
- ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව.
- ලිඛිත හා කථිත දෙමළ භාෂා පිළිබඳ ප්‍රවීණතාවය අතිරේක සුදුසුකමක් වනු ඇත.

**නියම හා කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත වසර දෙකක් සඳහා වේ.
- ව්‍යාපෘති ඉදිරි අවශ්‍යතාවය මත පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරනු ලැබිය හැකිය. පත්වීම් ලිපියේ සඳහන් පරිදි සේවය දීර්ඝ කිරීමේ හෝ අවසන් කිරීමේ පූර්ණ අයිතිය ලංකා විදුලිබල මණ්ඩලය සතුවේ.
- ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර සේවකයන් බඳවා ගැනීමකදී සුදුසුකමක් ලෙස මෙම පත්වීම සලකනු නොලැබේ.

**වෙනත් ප්‍රතිලාභ :**

- තෝරාගනු ලබන අයදුම්කරුවන් සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා දායකත්වය ලබන අතර සේවකයාගේ මාසික වැටුපෙන් 10%ක ප්‍රතිශතයක් හා ලං.වි.ම මගින් 15% ක ප්‍රතිශතයක් ඒ සඳහා බැර කෙරේ.
- සේවක භාර අරමුදල (ETF) සඳහා ලං.වි.ම මගින් 3% ක ප්‍රතිශතයක් බැර කෙරේ.

ලං.වි.ම වෙබ් අඩවියේ (https://www.ceb.lk/careers/en) ඇති අයදුම්පත පුරවා අන්තර්ජාලය මගින් ඉහත සඳහන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනය හා වේලාවට පෙර ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටී.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් පරීක්ෂාවෙන් තෝරා ගනු ලබන සීමිත අයදුම්කරුවන් පිරිසකගෙන් පමණක් මුද්‍රිත අයදුම්පත් සඳහා කැඳවීම් කරනු ලැබේ.

කිසිඳු ආකාරයකින් හෝ සිදු කරනු ලබන බලපෑමක් නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ආයතනවල සේවය කරන අයවළුන්ට මුද්‍රිත අයදුම්පත් සඳහා කැඳවීම් ලදහොත් එම අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී තම අංශ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළයුතු අතර, ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබීමකදී අයදුම්කරු රැකියා ස්ථානයෙන් නිදහස් කළ හැකිද යන බව පැහැදිලිව දක්වා තිබිය යුතුවේ.

**වැඩි විස්තර:**

**ව්‍යාපෘති අධ්‍යක්ෂ (ගල් අඟුරු බල ව්‍යාපෘති)**
**දුරකථන: 0112 580592/ 0112 580593**
**ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය (ගල් අඟුරු බල ව්‍යාපෘති),**
**අංක 45-1/1, ලෙයාඩ්ස් පාර,**
**කොළඹ 05.**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

Source: Dinamina, Daily News (2021.01.29)